# ගමක් මැකී ගමක් මැවේ

## පුරාණ ගම් මැකී යන අයුරු

කඩිනම් මහවැලි ව්‍යාපාරය අපේ මහඟු අනාගත බලාපොරොත්තුවයි. සහලින් රට ස්වයංපෝෂිත කිරීම, අවශ්‍ය අතිරේක ආහාර බෝග අප රටෙහිම නිෂ්පාදනය කිරීම, ඉඩම් අහිමිතා ගැටළුවලට ඉක්මන් විසඳුම, කෘෂි මූලික කර්මාන්ත හඳුන්වා දීම, රැකියා විරහිත භාවයට පිළියම්, ගොවිජනතාවගේ ජීවන තත්ව නඟා සිටුවීම සහ විදුලි බල නිෂ්පාදන වැඩිකිරීම ආදී අප සංවර්ධන පරමාර්ථයන් මුළුමනින්ම වාගේ කඩිනම් මහවැලි සංවර්ධන යෝධ ප්‍රයත්නයට බරදී ඇත. පවතින ජනාවාස රටාව වෙනුවට කාර්යක්ෂම නව ජනාවාස රටාවක් හඳුන්වා දීමෙන්, විෂම ඉඩම් අයිතිය වෙනුවට සමාන ඉඩම් අයිතියක් ඇතිකිරීමෙන්, දුෂ්කර ගමනා ගමන හා පරිවාහන පහසු කම් වෙනුවට යෝග්‍ය ගමනා ගමන සහ පරිවාහන පහසුකම් ඇතිකිරීමෙන්, පැරණි වගා ක්‍රම වෙනුවට විද්‍යාත්මක ගොවිකම් ක්‍රම හඳුන්වා දීමෙන්, සහ පවතින අසතුටුදායක ගොවිපළ පහසුකම් වෙනුවට කාර්යක්ෂම ගොවිකම් සේවා පහසුකම්ද, පවතින අඩු ආදායම් මට්ටම් (සාමාන්‍ය ගොවිපවුලක) වෙනුවට උසස් ගොවිපල ආදායමක්ද, ලබාදී ඒ තුළින් පොදුවේ ගොවිජනතාවගේ ආර්ථික සමාජයීය තත්වය වැඩිදියුණු කිරීම සහ සමස්ථ වශයෙන් රටේම කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි කිරීම මෙම ව්‍යාපාරයේ පොදු පරමාර්ථ යයි. මෙම නව සංවර්ධන උත්සාහයන් මගින්, පවතින ජනාවාස රටා, සමාජ කටයුතු ආදියෙහි වෙනසක් ඇතිවිය හැකිය. නව සංවර්ධනයෙහි තත්වය මනාව වටහා ගැනීමට නම් එම ප්‍රදේශ සංවර්ධනයට පෙර පැවති ආකාරය පිළිබඳවද දැනීමක් අවශ්‍යවේ. දැනට ප්‍රකාශයට පත්කර ඇති ලිපි ලේඛන සහ වාර්තා ආශ්‍රයෙන් මහවැලි සංවර්ධන ප්‍රදේශයන්හි සංවර්ධනයට පෙර පැවැති ජනාවාස රටා, ගොවිකම් කටයුතු සහ සමාජ ආර්ථික තොරතුරු ලුහුඩින් දක්වීම මෙම කෙටි ලිපියේ පරමාර්ථයයි.


පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි

**ධර්මදාස තෙන්නකෝන් විසිනි.**

ගොවිපල කළමණාකරණ සහ අලෙවි පර්යේෂණ අංශය.


මහවැලි සංවර්ධන ප්‍රදේශයේ එච් 1 සහ ඩී යන සංවර්ධන කලාපයන්හි (රජරට සහ තමන්කඩුව ප්‍රදේශයන්හි) සංවර්ධනයට පෙර ජනාවාස රටාව පිළිබඳ අධ්‍යයනයේදී එම්. යූ. ඒ. තෙන්නකෝන් මහතා විසින් 1966 දී සංස්කෘතික 13: 3 කලාපයේ ''පුරාණ ගමෙහි නොපෙනෙන පැත්ත'' යන හිසින් පළකරන ලද ලිපිය ඉතා වැදගත්ය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කරන ලද, එම්. යූ. ඒ. තෙන්නකෝන් මහතා විසින් රචිත ''මහවැලි සංවර්ධන ප්‍රදේශයේ ආර්ථික තත්වය පිළිබඳ කරන ලද නියැදි සමීක්ෂණයේ වාර්තාව'' යන හිසින් යුතු පර්යේෂණ ප්‍රකාශණයත්, ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ප්‍රකාශ කරන ලද ඒ. එස්. රණතුංග මයා ප්‍රධාන පර්යේෂණ කණ්ඩායමක් විසින් ලියන ලද ''සංවර්ධනයට පෙර මහවැලි ප්‍රදේශයේ ආර්ථික සමාජ තත්වය'' යන හිසින් යුතු පර්යේෂණ වාර්තාවත් පූර්ව මහවැලි සංවර්ධන කලාපයේ ජනාවාස හා ආර්ථික ඉතිහාසය, ජනාවාස ව්‍යාපාර වල බල පෑම, ජන විද්‍යාත්මක තොරතුරු, ඉඩම් භාවිතය සහ ඉඩම් පරිභෝජනය, කෘෂිකාර්මික තොරතුරු, නිවාස සහ සනීපාරක්ෂක තත්වයන් පිළිබඳ තොරතුරු සපයයි. පහත සඳහන් විස්තරයේදී මූලික වශයෙන් ඉහත සඳහන් ලිපි ලේඛන වලින් ලබාගත් තොරතුරු ආශ්‍රය කරගත් බව මෙහිදී සඳහන් කළ යුත්තකි.

17 වැනි සියවසේ දී සිට ක්‍රමයෙන් ජනාවාස වූ පුරාණ ගම් 19 වැනි සියවසේ මැද භාගයේදී සිට දියුණු කරන ලද ගොවිජනපද ව්‍යාපාර සහ 19 වැනි සියවසේ මුල සිට, ක්‍රමයෙන් වර්ධනය වූ (සමහර ඒවා ඓතිහාසික නගරවේ) දැනට ප්‍රධාන වෙළඳ සහ පරිපාලන

මධ්‍යස්ථාන බවට පත්ව ඇති නගර පවතින ප්‍රධාන ජනාවාස රටා වේ. දැනට පුරාණ ගම් සහ ගොවි ජනපද ව්‍යාපාර වශයෙන් හැඳින්වෙනුයේ ක්‍රි. පූ. 6 වැනි සියවසේ සිට ආර්‍යයන් විසින් දියුණු කරන ලද පසුව විනාශවී ගිය මෑත කදී නැවත දියුණු වූ හෝ කළ කෘෂිකාර්මික ජනාවාසවේ. ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන වශයෙන් දියුණුව ඇත්තේ අතීතයේදී දියුණුව තිබූ පසුව විනාශ වී ගිය ආගමික පරිපාලන සහ නාගරික මධ්‍යස්ථානයන්ය. දැනට ලැබී ඇති සාක්ෂි අනුව ක්‍රි: පූ: 6 වන සියවසේ සිට 12 වැනි සියවසේ පොළොන්නරු යුගයේ වැටීම තෙක් උතුරු මධ්‍යම වියළි කලාපීය ප්‍රදේශ සහ තමන් කඩුව ප්‍රදේශය රටේ සමෘද්ධිමත් කෘෂිකාර්මික ප්‍රදේශ වශයෙන් පැවතින. 12 වැනි සියවසෙන් පසු රාජධානි වෙනස් වීමත් සමඟම වියළි කලාපීය ගොවියාට හිමිව තිබූ සියලු පහසුකම් නැති වී යන්නට විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් නව රාජධානි ප්‍රදේශ [විශේෂයන් තෙත් Wet Zone කලාපීය ප්‍රදේශ] අවට ජනාකීර්ණ වන්නට විය. එහෙත් තම මුතුන්මිත්තන් දියුණුකළ ගම් බිම් වලින් පිටවී යෑමට මැලි වූ ගොවි පවුල් ස්වල්ප වශයෙන් ඉතිරි විය. එහෙත් වාරි මාර්ග මූලික වූ කෘෂිකර්මය එන්න එන්නම පිරිහී ගියේය. ගොවියන් ලෙඩ දුක් සහ සාගත රකුසාගේ ග්‍රහණයට අසුවීය. රොබට් නොක්ස් සහ ටෙනන්ට් වැනි සුදු ලේඛකයන්ගේ ලිපි වලට අනුව 16 වැනි සහ 18 වන සිය වස් අතර තුර නුවර කලාවියේ (අනුරාධපුර) සහ තමන් කඩුව (පොළොන්නරුව) ප්‍රදේශ වල පුරාණ ගම් වල ජීවත් වූ ගැමියන් දුගී භාවයෙන් සහ ලෙඩ රෝග වලින් නිරන්තරයෙන් පෙලුනේය. මේ අතර තුර කාලයේදී නුවර රාජධානියේ රජවරුන්ගේ සහ ප්‍රභූවරුන්ගේ තාඩන පීඩන නිසා ගොවි පවුල් දහස් ගණනින් රජරට ප්‍රදේශයට සංක්‍රමණය වන්නට විය. ඔවුහු නටබුන් පැරණි වැව් දියුණුකොට ජනාවාස පිහිටුවා ගත්හ. දැනට මහවැලි සංවර්ධන ප්‍රදේශයට අයත් වන ජනාවාස සියල්ලම වාගේ අද පවතින තත්වයට පත්වූයේ ඒ ආකාරයෙනි. සංවර්ධනයත් සමඟම දැනට සංවර්ධිත මහවැලි සංවර්ධන ප්‍රදේශවල මෙම පැරණි ජනාවාස රටාව සම්පූර්ණයෙන්ට මැකී ගොස්ය.

1815 බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය ලංකාවේ පාලනය භාර ගැනීමේ සිට 1 වන ලෝක යුද්ධය තෙක් කාලයේදී වියළි කලාපය දියුණු කිරීමට ඔවුන් විසින් කිසිදු ප්‍රයත්නයක් ගත්තේ නැත. එහෙත් තෙත් කලාපයේ වතු වැවිලි අංශයට ඔවුහු ඉමහත් අවධානයක් යොමු කළහ. එහෙත් බ්‍රිතාන්‍ය යුගයේ අගභාගයේදී දේශීය කෘෂිකාර්මික අංශය කෙරේ වැඩි අවදානය යොමු විය. 1930 ගණන්වල සංවර්ධනයට එවකට කෘෂිකම් ඇමති ධූරය ඉසුලූ ඩී. එස්. සේනානායක වැනි නායකයන්ගේ උනන්දුව මෙහිලා ප්‍රමුඛ විය. වියළි කලාපීය සංවර්ධනය සඳහා වැඩිම අවධානය යොමු කරන ලද්දේ නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය ඩී. එස්. සේනානායක මහතා විසිනි. ගොවිජනපද ව්‍යාපාර දියුණු කිරීම, පුරාණ ගම් වලට වාරිමාර්ග පහසුකම් ලබා දීම, මාර්ග සහ ගමනාගමන පහසුකම් ලබා දීම, අධ්‍යාපන, වෛද්‍ය පහසුකම් ලබාදීම සහ වැඩි දියුණු කිරීම මෙම අවදියේ ප්‍රධාන සංවර්ධන කාර්යන් විය. මෙම සංවර්ධන යුගය 1955 තෙක් පැවතින. රජයන් වෙනස් වීම සහ බලයට පත් රජයන්ගේ දේශපාලන දර්ශන විසින් මෙම ප්‍රතිපත්තියෙහි වෙනස් කම් ඇතිකරන ලදී. දීර්ඝ අඳුරු කාලයකට පසු "කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය" මගින් ඉතිහාසයේ මෙතෙක් නොවූ විරූ ලෙස මුළු රටේම සංවර්ධන වැයෙන් ඉතාම වැඩි කොටසක් වියළි කලාපීය ගොවිජනතාවගේ සංවර්ධන උදෙසා වෙන්වීම ගොවිජනතාවගේ මෙන්ම මුළු රටේම භාග්‍යයක් කොට සැලකිය යුතුය.

පුරාණ ගමක ඉඩම් සම්පත් ගැමියාගේ අවශ්‍ය තාවයන් අනුව නොයෙක් ආකාරයෙන් භාවිතා කරන ලදී. වැව් වල ජල ගැල්මට යටවූ ප්‍රදේශ, වාරිමාර්ග ඇල මාර්ග සඳහා වෙන්වූ ප්‍රදේශ, කුඹුරු ඉඩම්, ගෙවතු ඉඩම්, හේන් ගොවි බිම් සහ කැලෑ ඉඩම් සඳහා වූ ප්‍රදේශ වශයෙන් මෙම ඉඩම් භාවිතා කරන ලදී. මෙයින් 90% කටත් වඩා වෙන්ව තිබුනේ හේන් සහ කැලෑ ඉඩම් (රජය සතුවූ) වශයෙනි.

කුඹුරක ඉඩම් විශේෂ තැනක් ගත්තද ඉඩම් වැඩි ප්‍රමාණයක් ගමේ කිහිප දෙනෙකුට අයිතිව තිබුනි. අනෙක් ගොවියන් අද ගොවියන්ය. නමුත් සාමාන්‍යයෙන් කුඹුරු ඉඩම අයිතිය හෙක්ටයාර් 1ක් (අක්. 2.4) පමණය. ඉඩම් හිඟය කැපී පෙනෙන ගැටලුවක් විය. ඉඩම් අහිමි ගොවියන් වැඩි පුරම හේන් වගා කරන ලදී. හේන් ඉඩම් මෙන්ම කුඹුරු ඉඩම්ද ජලය හිඟවන කන්න වලදී විනාශ වී ගියේය. යල් කන්නයේදී, ජලය හිඟය නිසා කුඹුරු ඉඩම් සම්පූර්ණයෙන්ම වාගේ අත්හැර දමන ලදී. සාමාන්‍ය වී අස්වැන්න අක්කරයකට බුසල් 48.4 පමණ විය. දියුණු වාරිමාර්ග පහසුකම් සහ ව්‍යාප්ති සේවා ඇත්නම් මීට වැඩි අස්වැන්නක් ලබා ගත හැකි විය.

මහවැලි සංවර්ධන කලාපයට අයත්වන ගොවි ජනපද ව්‍යාපාර වලද පැවතුන බලවත්ම ප්‍රශ්නය

වූයේ ජල හිඟයයි. සමහර ගොවි ජනපද ව්‍යාපාර වල යල් කන්නයේදී කුඹුරු වගා නොවුනි. අස්වැන්නෙහිද වැඩි වෙනසක් නොවීය. එසේම දෙවැනි පරම්පරාවේ ජනගහණය ඉඩම් හිඟයෙන් සහ රැකියා හිඟයෙන් පීඩා විඳින අය විය. කෘෂිකාර්මික කම්කරුවන් වශයෙන් වැඩ කිරීමට හැකි වූයේද අවුරුද්දේ ඉතාම සුළු කාලයක් පමණි. කාර්මික අංශයේ රැකියා සොයා ගැනීමද දුෂ්කර විය. මේ නිසා මොවුන් ගොවිජනපද ව්‍යාපාර මායිමෙන්වූ රජයේ කැලෑ වල හේන් ගොවිතැන කරන්නට විය. සමහරු රජයේ ඉඩම් වල අනවසරයෙන් පදිංචි වූහ. ජලය හිඟය, අඩු කෘෂිකාර්මික දැනීම සහ අප්‍රමාණවත් කෘෂිසේවා නිසා ජනපදිකයන් අතර බෙද දෙන ලද ගොඩ ඉඩම් කට්ටිවලින් වැඩි ප්‍රයෝජනයක් නොලැබුනි. හේන්වල මිරිස් වැනි බෝග වගා කිරීමෙන් ගොවියා සෑහෙන ආදායමක් ලබා ගත්තද වසරෙන් වසර විනාශ කරන ලද වන සම්පත් ප්‍රමාණය කොපමණද? යන්න කල්පනා කර බැලීමෙන් අනාර්ථික ලෙස වන සම්පත විනාශ කිරීමේ අයෝග්‍යතාවය මොනවට පැහැදිලි වේ.

ගමක කුටුම්බ [ගෘහ] ප්‍රමාණය එකේ සිට සිය ගණනක් දක්වා වෙනස් වේ. ගොවිජනපද ව්‍යාපාර වල නම් ජනපදික පවුල් 300 කට හෝ – 400 කට හෝ වැඩිය වාරි මාර්ග පහසුකම්, ගෙවල් දොරවල් වල තත්වය, පරිවාහන පහසුකම්, සහ සෞඛ්‍ය සහ අනෙකුත් පහසුකම් අතින් බලන කල රජයේ අනුග්‍රහය යටතේ පිහිටවූ ගොවි ජනපද ව්‍යාපාරයක් පුරාණ ගමකට වඩා යහපත්ය. මෙම දියුණුව, දිවයිනේ නොයෙකුත් පළාත් වලින් රජරට ප්‍රදේශයට ජනසංක්‍රමණ ඇතිවීමට හේතු විය. සාමාන්‍යය කුටුම්බ විශාලත්වය [ගමක සහ ගොවිජනපද ව්‍යාපාරයක] පුද්ගලයන් 6.99 කි. අපහසුතාවයන් මධ්‍යයේ පුද්ගලයන් වැඩි සංඛ්‍යාවක් මෙම නිවාස වල ජීවත්වන බව මෙයින් අපට සිතාගත හැකිය.

ජනගහණයෙන් 37.12% වයස අවුරුදු 14 ට අඩු අය වූහ. අවුරුදු 65 ඉක්මවූ ජනගහණය 2.72% කි. මේ අනුව මුළු ජනගහණයෙන් 39.84% ක් [රැකියාවක් කළ නොහැකි] යැපෙන්නන් විය. ජනගහණයෙන් 38% ක් පමණ අවුරුදු 20-64 දක්වා වයසේ අය විය. අවුරුදු 14 ට අඩු ජනගහණයෙන් වැඩි කොටසක් අවුරුදු 10 ට අඩු ළමයින් වීම විශේෂ ලක්ෂණයකි. යහපත් සෞඛ්‍ය සේවා යටතේ ළදරු උපත් සුරක්ෂිත වීම මේ ජනගහණ වැඩිවීමට හේතු වේ.

ලිංග භේදය අනුව, ජනගහණයෙන් 52.56% ක් පුරුෂයන්ය. වයස අවුරුදු 65 ට වැඩි ජනගහණයෙන්, පුරුෂපක්ෂයේ ප්‍රතිශතය ස්ත්‍රී පක්ෂයේ ප්‍රතිශතය මෙන් දෙගුණයකි. වැඩිපුර දරුවන්



ගමෙහි නව පදිංචිකරු: ට්‍රැක්ටරය ගැමි දිවිය වෙනස් කරයි.

ලැබීම, ගෙදර දොර වැඩ සේම ගොවිපලේ වැඩ වලදීද වියළි කලාපයේ ස්ත්‍රීන් වැඩිපුර ශ්‍රමය යෙදීම සහ සනීපාරක්ෂක කටයුතු කෙරෙහි දක්වන අඩු සැලකිල්ල ආදී කරුණු නිසා ස්ත්‍රී පක්ෂයේ ජීවන කාලය පුරුෂපක්ෂයට වඩා අඩුවන බව පෙනේ. අවුරුදු 40 ක ස්ත්‍රියක් වුවද පෙනුමෙන් අවුරුදු 60 ඉක්මවූයේය. මේ නිසා වර්තමාන ප්‍රජාසංවර්ධන වැඩ පිළිවෙලවල් මගින් මෙම පුරාණ ගම්වල කාන්තාවන්ගේ ජීවන තත්වය නඟා සිටුවීම කෙරේ වැඩි සැලකිල්ලක් දැක්විය යුතුව තිබේ..

වයස අවුරුදු 6 ට වැඩි ජනගහණයෙන් 88% කට කියවීමට හා ලිවීමට හැකියාව තිබීම විශේෂ ලක්ෂණයකි. නූගත් ජනගහණයෙන් වැඩි කොටස අවුරුදු 40 ඉක්මවූ ස්ත්‍රී පක්ෂය වේ. පහළ වයස් තත්වයේ ජනගහණය ගෙන බලන විට, නූගත් කොටස වැඩි වශයෙන් සමන්විත වූයේ වයස අවුරුදු 6 හා 9 අතර කොටසය. බොහෝ විට කරුණු කිහිපයක් නිසා ළමුන් පාසැල් යාම නවතා දමති. බොහෝ දෙමව්පියන් දුප්පත් නිසා ඇඳුම් සහ පොත් පත් සැපයීම නොහැකි වීම පළමු වැන්නය. දෙවැන්න, දෙමාපියවරු, ඔවුන් ගොවිපලේ වැඩ කරන විට බාල සොහොයුරු සොහොයුරියන් රැකබලා ගැනීමට තම ළමුන් ගෙවල් වල නවතා ගනිති. එසේම පාසැල් බොහෝ දුරින් පිහිටීම නිසා දෙමාපියන් අවුරුදු 9-7 අතර ළමුන් පාසැල් යැවීමට මැලි වෙති. එසේම බොහෝ පාඨශාලා ප්‍රාථමික ඒවාය. උසස් අධ්‍යාපන සඳහා දුර ගෙවා නගර වල පාසැල් වලට යාමට සිදුවිය.

රැකියා අංශයෙන් බලන විට ඌණ රැකියා නියුක්තිය විශේෂ ලක්ෂණයකි. ගොවිතැන් වැඩ වලදී වැඩ අධික කාලය වන ඉඩම් සකස් කිරීමේ වැපිරීම සහ අස්වනු නෙලීම යන කාල හැර අනෙක් කාල වල කිරීමට තරම් වැඩක් ගොවියාට නැත. මෙය ඉඩම් හිමි ගොවියාට මෙන්ම කම්කරුවන්ටද බලවත් ගැටළුවකි. කාන්තාවන්ට නම් සෑහෙන තරම් කටයුතු තිබේ. ගොවිපලෙන් පසු ගෙදර දොර වැඩ ළමුන්ගේ කටයුතු ආහාර පාන සකස් කිරීම ආදී කාර්යයෙහිදී සම්පූර්ණයෙන්ම නියැලෙනුයේ කාන්තා පක්ෂයයි.

පුරාණ ගම්වල නිවාස වැඩි කොටස සම්ප්‍රදායිකත්වයේ ඒවාය. වරිච්චි බැඳ කටුමැටි ගසා සාදන ලද බිත්ති සහ දුවවලින් සාදන ලද අතු හෝ පිදුරු සෙවිලි කරන ලද වහල සම්ප්‍රදායික නිවාස වල පොදු ලක්ෂණයකි. ගොවිජනපද ව්‍යාපාර වල නම් ජනපදිකයින්ට ගඩොලින් බැඳ උලු සෙවිලි කළ නිවාස ලැබී ඇතද, දෙවන පරම්පරාවට අයත් පවුල් සහ සංක්‍රමණිකයන්ගේ ගෙවල් වැඩි කොටස මැටියෙන් සාද සෙවිලි කරන ලද තාවකාලික නිවාස වේ. දළ වශයෙන් නිවාස වලින් 53% ක් සම්ප්‍රදායිකතත්වයේ නිවාස වේ. 47% ක් වැඩි දියුණු කරන ලද නිවාස වේ. පසුගිය වර්ෂවල කෘෂිකාර්මික කම්කරුවන් සහ ගොවියන් ලද ලාභය මෙම දියුණුවට හේතු වී ඇත. සනීපාරක්ෂක අංශයෙන් බලන විට බොහෝ අසතුටුදායක ය. බොහෝ තාවකාලික නිවාස ඉස්තෝප්පුවක් සහ එක කාමරයකින්ද, ඉතා කුඩා කුස්සියකින්ද යුතු විය. සාමාන්‍ය වශයෙන් මෙම නිවසක පුද්ගලයන් 6 ක් පමණ ජීවත් වූහ. නිවාස වැඩි කොටසක්ම වැසිකිළි පහසුකම් වලින් සමන් විත නොවීය. බීමට ගන්නා ජලය පොදු ළිඳකින් හෝ වැවකින් ලබා ගත්තේය. නෑම රෙදි සේදීම සඳහාද පොදු ළිං හෝ ජලාශ වෙත යෑමට සිදු විය.

ගෙදර දොර පාවිච්චියට සෑහෙන තරම් බඩු මුට්ටු නොවීය. පුටු, මේස, ඇඳ ආදිය භාවිතා කරන ලද්දේ සාපේක්ෂව සුළු කුටුම්බ ප්‍රමාණයකි. බොහෝ ගොවි කුටුම්බ අඩු ගණනේ නගුලක් වත් හිමිව නොතිබුනි. එහෙත් නිවාස බොහොමයකම රේඩියෝ යන්ත්‍ර සහ මහන මැෂින් තිබුනි. මෙම පුරාණ ගම්වල සෑම නිවසකටම පොදු වූ ගොවිපල උපකරණ නම් උදැල්ලයි.

බොහෝ සේවා පහසුකම් ඒකරාශිවී තිබුණේ ප්‍රදේශයේ ප්‍රධාන නගර වලටය. බොහෝ දුර ගෙවා ගොස් මෙම සේවා ලබාගත යුතු විය. පසුගිය දශක 4-5 ඇතුළත වියළි කලාපයට ජනගහණය සංක්‍රමණය සහ මාර්ග දියුණුව නිසා මාර්ග අසල පිහිටි සමහර ජනාවාස කුඩා නගර බවට ව්‍යාප්ත විය. බොහෝ ගම්වල වැසියනට, කෘෂිකාර්මික, තැපැල් සේවා වැනි සේවා ලබා ගැනීමට සැතපුම් 16 කටත් වඩා දුර ගමන් කිරීමට සිදු විය. දුෂ්කර වූ මාර්ග රටාවක් පැවැතීම විශේෂ බාධාවක් විය. මෙම මාර්ගවලින් වැඩි කොටස කරත්ත පාර වූ අතර අනෙක් කොටස අඩිපාර විය. පොදු වාහනය වූයේ බයිසිකලයයි. ට්‍රැක්ටර් [රෝද 4 සහ රෝද 2] කෘෂිකාර්මික කටයුතු වලට සේම ගමනාගමන සහ පරිවාහන කටයුතු වලට යොදගැනීමට විශේෂ ලක්ෂණයකි. පවත්නා මාර්ග රටාවට වඩාත්ම උචිත වාහනයද ට්‍රැක්ටරය වීම මෙයට හේතුවයි.

මෙකී දුෂ්කරතා මැඩ ගොවි ජනතාවගේ ජීවන තත්වය නඟා සිටුවීම කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ ප්‍රමුඛ පරමාර්ථයයි.